# ඇඩම් ස්මිත්

# 01 පසුබිම

- වාණිජ ධනවාදය (Commercial Capitalism) කාර්මික ධනවාදයට (Industrail Capitalism) පරිවර්තනය වීම ආර්මභ විය.
- මේ නිසා වාණිජවාදයට එරෙහිව යන මතවාද යුරෝපය තුළ බිහිවන්නට විය.
- කාර්මික ධනවාදයත් ඒ සමගම ඇති වූ දේපාලන පරිවර්තනය මගින් ආර්ථික නිදහස්කරණයේ අවශ්‍යතාව අවධාරණය විය.
- ඒ නිසා වාණිජවාදය වෙනුවට වෙනත් ආර්ථික මතවාද බිහිවීම ආරම්භ විය.

# 02. පිසියොක්‍රැස්ටවාදීන් (Physiocrats)

- 1756 - 1778 කාලය තුළ ප්‍රංශය මූලික කරගෙන මෙම මතවාදය පැතිර ගියේය.
- ස්වභාවික පිළිවෙත (Natural Order) ඔවුන්ගේ මූලික මූලධර්මය විය.
- ශුද්ධ නිපැයුම (Net Product) ඔවුන්ගේ මූලික මූලධර්මයක් වූ අතර ද්‍රව්‍යමය අතිරික්තයක් ඉන් අදහස් විය.
- ධනයේ සංසරණය (Circulation of Wealth) ඔවුන්ගේ තවත් මූලධර්මයක් විය.
- එක් බදු ක්‍රමයක් (a single tax ) සහ නිදහස් වෙළදාම අනෙක් මූලධර්මයන් විය.

# 03. ඇඩම් ස්මිත් චරිතය

- 1723 දී උපත ලැබීය.
- 1737 සිට 1740 දක්වා ග්ලාස්ගෝ විශ්වවිද්‍යාලයේ දී අධ්‍යාපනය ලැබීය.
- 1740 - 46 ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයේදී අධ්‍යාපනය ලැබීය.
- 1751 ග්ලාස්ගෝ විශ්වවිද්‍යාලයේ මහාචාර්යවරයා විය.
- 1764 දී Buccleuch ආදිපාදවරයාගේ ගුරු තනතුර භාරගත් අතර ඔහු සමඟ යුරෝපයේ සංචාරය කළේය.
- එහිදී පිසයෝක්‍රාට්ස්වරුන් සමඟ සම්බන්ධතා පැවැත්විය.
- ප්‍රංශයේ දී ඔහු "ජාතීන්ගේ ධනය" (Wealth of Nations)ලිවීම ආරම්භ කළේය.

## 04 ස්මිත්ගේ ප්‍රකාශනය

- Theory of moral sentiments (1759) මෙය යුරෝපා ආර්ථික විද්‍යාඥයන් හමුවීමට පෙර ප්‍රකාශයට පත් කළ එකක් විය.
- An Inquiry into the Nature and causes of the wealth of Nations 1776 මෙම කෘතිය නිසා ඔහු ආර්ථික විද්‍යාව බිහි කළේ යැයි සැලකේ.
- එහෙත් Richard Cantillon's Essai sur la Nature du Commerce 1775 ප්‍රකාශයට පත් කර ඇති අතර සියවසකට පසු එය සොයා ගැනීමෙන් පසු ඔහු මූලිකයාය යන මතය ප්‍රකාශ වී ඇති
- එහෙත් ඉන් ස්මිත්ගේ බලපෑම් අඩු නොවේ.

## 05. ස්මිත්ගේ දර්ශනය

- සියලුම පුද්ගලයන් ස්වාර්ථය මුල් කරගෙන ක්‍රියා කරති.
- සියලුදෙනාටම තමන්ගේ තත්ත්වය ඉහළ නංවා ගැනීමට අවශ්‍ය වේ.
- පුද්ගලයා තමන්ගේ කටයුතු පිළිබඳව හොඳම තීරණ ගන්නා තැනැත්තා වේ. නිදහස ලැබූ විට ඔහු හොඳම තීරණය ගනියි.
- පුද්ගලයා නිදහසේ කටයුතු කිරීම තුළින් ඔහුගේ අභිවෘද්ධිය ඇති කර ගන්නා අතර එය සමාජ අභිවෘද්ධියට හේතු වේ.

# 06. ජාතීන්ගේ ධනය

- ජාතීන්ගේ ධනය යනු විදේශ වෙළදාම හෝ භූමිය නොවේ.
- එය තීරණය වන්නේ ශ්‍රමය අනුවය. එය ශ්‍රමයේ නිෂ්පාදනයයි.
- ජාතීන්ගේ ධනය යනු ධනයේ මූල්‍ය වටිනාකම නොවේ.
- එහි මූර්ත වටනාකමයි.
- සමාජයක ද්‍රව්‍යාත්මක වටිනාකම එම සමාජයේ ඒක පුද්ගල ආදායම වේ.

$$\frac{DS + E - I}{TCP}$$

# 07. ශ්‍රම විභජනය (Dvision of Labour)

- ස්වාභාවික හැකියාව ශ්‍රම විභජනය තුළින් ඉහළ නැංවේ.
- නිෂ්පාදන අතිරික්තයක් ඇති කර ගැනීමේ අවශ්‍යතාව මත ශ්‍රම විභජනය ඇති වේ.
- එමගින් ශ්‍රම නිෂ්පාදනය ඉහළ යයි. ඒ නිපුණතාව ඉහළ යාම, කාලය ඉතිරිකර ගැනීම සහ නවෝත්පාදනවලට ඉඩ ලැබීම සහ යන්ත්‍ර සූත්‍ර භාවිතය මගිනි.

## 08. වෙළෙඳපොළ අවශ්‍යතාවය

- ශ්‍රම විභජනය වෙළෙඳපොළ විශාලත්වය අනුව සීමා වේ.
- නිෂ්පාදනය වැඩි වන්නේ ඒවා අලෙවි කළ හැකි නම් පමණි.
- වෙළෙඳපොළ වර්ධනය නොවන විට ශ්‍රම විභජනය වර්ධනය නොවේ.
- එමෙන්ම එය ප්‍රාග්ධන සම්පාදනය අනුව ද වෙනස් වේ.
- ප්‍රාග්ධනය යනු ජාතික ධනයේ මීට පෙර උපයාගත් පරිභෝජනය නොකළ කොටසයි.

# 09. අදෘෂ්‍යමාන හස්තය (Invisible hand)

- භාණ්ඩයක් වෙළෙඳපොළේ අලෙවි වන මිල සැබෑ මිල ලෙස හැඳින්වේ.
- මිල තීරණය වන්නේ සැපයුම සහ සැබෑ ඉල්ලුම (Effectual demand)මතය. සැබෑ ඉල්ලුම යනු හැකියාව සහ ගෙවීමට පෙළඹුම සහිත ඉල්ලුමයි.
- මිල තීරණය වීම සඳහා සැපයුම් සහ ඉල්ලුමට අමතරව සැපයුම් නම්‍යතාව ද ඒ සඳහා බලපායි.
- එයින් අදහස් වන්නේ සැපයුමේ සහ ඉල්ලුමේ හැසිරීම අනුව මිල තීරණය වන බවයි.
- ඒ අනුව ආර්ථිකයක වෙළෙඳපොළ තීරණය වන්නේ ප්‍රධාන සාධකය මිල හෙවත් අදෘෂ්‍යමාන හස්තයෙනි.

# 10. රාජ්‍ය නිර්බාධවාදය (Laissez – Faire)

- පුද්ගලයාට නිදහසේ කටයුතු කිරීමට ඉඩදීම මගින් නිෂ්පාදනය ඉහළ යයි.
- ඒ තුළින් රටෙහි ආර්ථික වර්ධනය ඉහළ නංවාගත හැකිය.
- රජය ආර්ථිකයේ නිෂ්පාදන කටයුතුවිලින් ද වෙළෙඳපොළ කටයුතුවලින් ද ඉවත් විය යුතුය.
- අදෘෂ්‍යමාන හස්තය මගින් ආර්ථිකය හැසිරවෙන විට ආර්ථිකය වර්ධනය වේ.
- ජාතියේ ධනය ඉහළ නංවාගත හැක්කේ රාජ්‍ය නිර්බාධවාදයට ඉඩ දීම මගිනි.

# 11. ඇඩම් චින්තනමය බලපෑම

- ලොව සම්භාව්‍ය ආර්ථික මතවාද (Classical Economic Theories )ඇති වීම සඳහා පදනම වැටුණි.
- ඉන් පසු වසර 160 ක කාලය තුළ ධනවාදී ආර්ථික මතාන්තර වර්ධනය සඳහා මුල් විය.
- ආර්ථික අර්බුද සහ වෙනස්වීම් නිසා රාජ්‍ය නිර්බාධවාදයට යම් යම් බලපෑම් එල්ල වුවද රාජ්‍ය නිර්බාධවාදය අඛණ්ඩව ක්‍රියාත්මක විය.
- දෙවන ලෝක යුද්ධයට ආසන්න අවස්ථාව දක්වා ආර්ථික චින්තනයේ පදනම එය විය.

# 12. පසුකාලීන චින්තනයන්

- සම්භාව්‍ය ආර්ථික න්‍යාය විස්තර කෙරෙන සංශෝධනය කෙරෙන නව අංග එකතු කෙරෙන චින්තනයන් පසු කාලයේදී වර්ධනය විය.
- David Ricardo – සාපේක්ෂ පිරිවැය න්‍යාය - විදේශ වෙළෙඳාම මගින් සෑම රටකටම වාසි සැලසෙන ආකාරය.
- Thomas Robert Malthus, ජන සංඛ්‍යා න්‍යාය, ජන සංඛ්‍යාවේ වර්ධනය  සම්භාව්‍ය මතවාද වලට අනුකූලව හැඩගැස්විය.
- Jeramy Bentham – උපයෝගිතාවාදය  Utiitarism ඉදිරිපත් කළ අතර තවත් ආර්ථික විද්‍යාඥයන් රැසක් එම මතවලට අනුකූලව සම්භාව්‍ය ආර්ථික විද්‍යාව පෝෂණය කළහ.